
4 වැනි සැසිය

**ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස උල්ලංඝනයවීම්**

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත


ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස උල්ලංඝනයවීම් අවබෝධ කර ගැනීම

THE LOCAL
CHANGEMAKERS
COURSE

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත

## ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස උල්ලංඝනයවීම් අවබෝධ කර ගැනීම


*4 වැනි සැසියේ ඉදිරිපත් කිරීම සඳහා වන පිටපත අදාළ ඉදිරිපත් කිරීමෙහි අංක 4 සිට 39 දක්වා වන ස්ලයිඩ මගින් නිරූපණය වේ.*

**සටහන**: මෙම ඉදිරිපත් කිරීම දීර්ඝ ඉදිරිපත් කිරීමක් වන අතර (මිනිත්තු 20 ට වඩා තරමක් අඩු ය) එහි බොහෝ උදාහරණ ඇතුළත් වේ. ඔබේ කණ්ඩායමට අඩුවෙන් ම අදාළ යැයි පෙනී යන උදාහරණ කපා හැරීමට ඔබට අවශ්‍ය විය හැකි ය. ඔබේ සන්දර්භය තුළ ඇති කතා යොදා ගනිමින් උදාහරණ කිහිපයක් ආදේශ කිරීමටද ඔබට අවශ්‍ය විය හැකි යි. '... පිළිබඳ කතන්දර' කොටස්වල ප්‍රධාන පණිවුඩ තද අකුරින් ඉස්මතු කර පෙන්වා ඇත. කරුණාකර මෙම කරුණු ඔබේ කතාවට ඇතුළත් කරන්න! ඔබගේ සහභාගීවන්නන්ට මෙහි අන්තර්ගතය අවබෝධ කර ගැනීමට උපකාරී වනු පිණිස පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම්, ප්‍රධාන පවර්පොයින්ට් ස්ලයිඩ්වල මුද්‍රිත පිටපත් හෝ එයට සමානව සැකසූ ෆ්ලිප් චාර්ට් නිරූපණ භාවිතා කරන්න.

**හැඳින්වීම**




ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස නොමැතිකම නිසා විවිධ රටවල විවිධාකාර මිනිසුන් ගැටලුවලට මුහුණ දෙනවා. වෙනස් වන එකම දේ නම්, බලපෑමට ලක්වන්නේ කවුරුන්ද, උල්ලංඝනයවීම් වල බරපතලකම කොතෙක්ද සහ ඒවා සිදු කරන්නේ කවුරුන්ද යන කාරණා ය.





මෙම ඉදිරිපත් කිරීමේ දී අපි වෙනස්කොට සැලකීම, අයිතිවාසිකම් සීමා කිරීම සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සැබෑ ජීවිත කතාවලට සවන් දෙනවා.



මෙම උල්ලංඝනයවීම් සිදු කරන්නේ රජය සහ ප්‍රජාවේ පුද්ගලයින් යන දෙපාර්ශ්වය ම විසින්. අපි බොහෝ විට මෙය හඳුන්වන්නේ රජයේ උල්ලංඝනයවීම් සහ සමාජ එදිරිවාදිකම් ලෙස යි. නමුත් උල්ලංඝනයවීම් පවුල තුළ සහ ආගමික ප්‍රජාවන් තුළ ද සිදුවිය හැකියි.




මීට අමතරව හතර වැනි උල්ලංඝනයවීම් වර්ගයකුත් තිබෙනවා: ඒ, ප්‍රජාව තුළ සිදුවන උල්ලංඝනයවීම් වලින් ජනතාව ආරක්ෂා කිරීමට රජය අපොහොසත් වීමයි. තම භූමිය තුළ සිටින සෑම මිනිසෙකු ම වෙනස්කොට සැලකීමෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම් අනවශ්‍ය ලෙස සීමා කරනු ලැබීමෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමේ වගකීමක් රාජ්‍යයට තිබෙනවා. බොහෝ රාජ්‍යයන් මෙය ඉටු කිරීමට අපොහොසත් වෙනවා.



වෙනස්කොට සැලකීම, අයිතිවාසිකම් සීමා කිරීම සහ ප්‍රචණ්ඩත්වය සාමාන්‍යයෙන් එකිනෙකට අන්තර්-සම්බන්ධ සහ අතිච්ඡාදනය වන කරුණු වෙයි. උදාහරණයක් ලෙස, යම් සීමා කිරීමක් වෙනස් කොට සැලකීමක් විය හැකි අතර එය ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකියි. බොහෝ විට රජයේ උල්ලංඝනය කිරීම් සහ සමාජ එදිරිවාදිකම් එකිනෙක කෙරෙහි දායක වෙමින් විෂම චක්‍රයක් නිර්මාණය කරනවා.

සුළුතර කණ්ඩායම්වලට වෙනස් කොට සලකන ආකාරයේ රජයේ නීති මගින් සමාජයේ නොඉවසීම නීත්‍යානුකූල කරවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාව තුළ වෙනස් කොට සැලකීම, හිරිහැර කිරීම සහ ප්‍රචණ්ඩත්වය සිදු වෙනවා. බලධාරීන් ඒවා නොදුටුවා සේ සිටිය හොත්, ඒවා සිදු කරන පුද්ගලයින් ඒවාට දඬුවම් නොලබා සිටිය හැකි යැයි සිතනවා. එවිට එම වෙනස්කොට සැලකීම නිසා, හිරිහැර සහ ප්‍රචණ්ඩත්වය තව තවත් නරක අතට හැරෙනවා.

සැබෑ ජීවිත කතා කිහිපයක් භාවිතා කරමින් ලෝකයේ විවිධ ප්‍රදේශවල සිදුවන වෙනස්කොට සැලකීම්, සීමා කිරීම් සහ ප්‍රචණ්ඩත්වය කෙබඳු විය හැකි දැයි අපි බලමු! සමහර විට ඒවායින් සමහරක් ඔබේ අත්දැකීම් වලට අදාළ ඒවා විය හැකියි.

## වෙනස්කොට සලකනු ලැබීම පිළිබඳ කතන්දර



**වෙනස්කොට සැලකීම ඉතා සුලභ වන අතර එය ජීවිතයේ සෑම අංශයකටම බලපායි.** පූජ්‍ය කුමාර් පාදිලි තුමා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශයක සිටින පාදිලිවරයෙක්. ඔහුගේ පවුල ඔහුගේ ගමේ බහුතර බෞද්ධ ප්‍රජාව සිදු කරන වෙනස්කොට සැලකීම්වලට මුහුණ දී තිබෙනවා. ගුරුවරුන් සහ පංතියේ ළමයින් ඔහුගේ දරුවන්ට හිරිහැර කර ඇති අතර, ඔවුන්ගේ නිවස නීති විරෝධී වන්දනා කරන ස්ථානයක් ය කියමින් ඔවුන්ගේ විදුලිය හා ජල සැපයුම අක්‍රිය කරනු ලැබුවා.[1]

---



**සමහර රජයයන් රජයේ මුදල් වෙන්කර දීමේදී වෙනස්කොට සලකනවා** – සුළුතර කණ්ඩායම් සිටින ප්‍රදේශවල යටිතල පහසුකම්, සෞඛ්‍යය හෝ අධ්‍යාපනය සඳහා ඉතා අඩුවෙන් ආයෝජනය කිරීම උදාහරණයක් ලෙස දැක්විය හැකියි. මෙය වාර්ගික ආතතිය සහ දේශපාලන අස්ථාවරත්වය පිළිබඳ දිගු කාලීන අවදානම් ඇති කළ හැකියි.

**ආයතන ක්‍රියාත්මක වන ආකාරයෙන් ද වෙනස්කොට සැලකීම සිදුවිය හැකියි.** උදාහරණයක් ලෙස, පාසල් සිසුන්ට වෙනස්කොට සැලකීම, නිල වශයෙන් සිදුකරන ආගමික කටයුතු වලට ඔවුන්ව බලහත්කාරයෙන් සහභාගී කරවීම හෝ ඔවුන්ගේ ප්‍රජාව පිළිබඳ වැරදි ලෙස කථා කරන පෙළපොත් භාවිතා කිරීම වැනි දේවලට මුහුණ දීමට ඔවුන්ට සිදු විය හැකියි. කලාතුරකින් ඇතිවන තත්වයන්හි දී, සමහර කණ්ඩායම්වලට අධ්‍යාපනය අහිමි වී තිබේ – ඉරානයේ බහායිවරුන්ට විශ්වවිද්‍යාලය අධ්‍යාපනය ලැබීමට අවසර ලැබෙන්නේ නැහැ.[2]

## සීමා කිරීම් සහ වෙනස්කොට සැලකීම් පිළිබඳ කතන්දර



**බොහෝ වර්ගවල නීති මගින් සෘජුව හෝ වක්‍රව වෙනස්කොට සැලකීම සඳහා හේතු වන සීමා නිර්මාණය කෙරෙනවා. බැලූ බැල්මට මධ්‍යස්ථ බවක් පෙනෙන්නට තිබිය හැකි සැලසුම්කරණය සම්බන්ධ නියමයන් සුළුතර කණ්ඩායම් පූජනීය ස්ථාන ඉදිකිරීම වළක්වන සුලභ බාධකයක්.**

රුසියාවේ සුළුතර කණ්ඩායම් රාශියක් දුෂ්කරතාවන්ට මුහුණ දී තිබෙනවා – ඉදිකිරීම් සඳහා අවසර ලබා නොදීම, ඉදිකිරීම් ආරම්භ කිරීමෙන් පසු නාගරික කල්බදු අවසන් කිරීම, හෝ ඉදිකිරීම් කඩා ඉවත් කිරීම උදාහරණ හැටියට දැක්විය හැකියි.[3]

---



**ආගමික ප්‍රජාවන් ලියාපදිංචි කිරීම පාලනය කෙරෙන නීති ද සීමාකාරී සහ වෙනස්කොට සලකන ආකාරයේ නීති විය හැකියි.** ආගමික හෝ වෙනත් සියලු ම කණ්ඩායම්, ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිදු කිරීමට පෙර සංගමයක් ලෙස ලියාපදිංචි විය යුතු යැයි ඇල්ජීරියානු රජය නියම කර තිබෙනවා. කුඩා පිරිසක් වන අහමදියා ප්‍රජාවට ලියාපදිංචිය ලබා දී නැහැ. 2020 අවසානය වන විට, අනවසර ස්ථානවල යාච්ඤා කිරීම වැනි අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබූ ප්‍රජා සාමාජිකයින්ට එරෙහිව නඩු 220 ක් විභාග වෙමින් පැවතියා.[4]

---



**සමහර රජයන් බහුතර ප්‍රජාවන්ගේත් ආගමික වත්පිළිවෙත් සීමා කරනවා**. 2020 දී ටර්ක්මෙනිස්තානයේ ලෙබාප් ප්‍රදේශයේ බලධාරීන් සිකුරාදා යාච්ඤාවලට ගුරුවරුන් හා හෙදියන් වැනි රජයේ සේවකයින් සහභාගී නොවිය යුතු යැයි නියෝග කළ අතර, ඔවුන් පල්ලිවල සිටිනු දුටුව හොත් ඔවුන්ව සේවයෙන් පහකරන බවට තර්ජනය කළා.[5]

---

[1] ප්‍රාදේශීය මූලාශ්‍ර
[2] ද ගාර්ඩියන්, https://www.theguardian.com/world/2013/feb/27/bahai-student-expelled-iranian-university
[3] ෆෝරම් 18, https://www.forum18.org/archive.php?article_id=2508
[4] එ.ජ. රාජ්‍ය දෙපාර්තමේන්තුව, https://www.state.gov/reports/2020-report-on-international-religious-freedom/algeria/
[5] ෆෝරම් 18, https://www.forum18.org/archive.php?article_id=2555



සීමාවන් නිර්මාණය කළ හැකි තවත් නීති වර්ග 2 ක් පිළිබඳව අපි සාකච්ඡා කරමු: ඒවා නම්, පවුල් නීතිය සහ දේවාපහාස නීතිය හෝ ආගම අත්හැර දැමීමේ නීතිය යි.

**පවුල් නීතිය**
**විවාහය, දික්කසාදය, උරුමය සහ ළමයින්ගේ භාරකාරත්වය පාලනය කෙරෙන සාමාන්‍ය නීති හා ආගමික නීති යන දෙකම අයිතිවාසිකම් සීමා කිරීමට සහ වෙනස් කොට සැලකීමට හේතු විය හැකියි.**

---



ඉන්දියාවේ, ආගම් දෙකකට අයත් යුවළක් විවාහ වීමේදී විවාහයට දින තිහකට පෙර මහේස්ත්‍රාත්වරයෙකුට දැනුම් දිය යුතු යැයි වෛහික විශේෂ විවාහ පනත මගින් නියම කර තිබෙනවා. මහේස්ත්‍රාත්වරයා අයදුම්පත විමර්ශනය කර යුවළගේ පවුල් වෙත දැන්වීමක් යවයි. මෙය, බොහෝ යුවල් ගරුත්වය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ අවදානමට ලක් කරයි.[6]

---



රේවතී මසෝසෙයි මැලේසියානු ජාතික කාන්තාවක්. ඇය මුස්ලිම් දෙමව්පියන්ට දාව උපත ලැබුවත් ඇයගේ හින්දු මිත්තණිය විසින් ඇයව හින්දු භක්තිකයෙකු ලෙසයි ඇති දැඩි කළේ. හින්දු භක්තිකයෙකු විවාහ කරගෙන නැවත ඉස්ලාම් ආගමට පැමිණීම ප්‍රතික්ෂේප කිරීම නිසා ආගමික අධිකරණයක් ඇයව මාස 6 ක කාලයක් සඳහා ඉස්ලාමීය නැවත-අධ්‍යාපන මධ්‍යස්ථානයකට යවා තිබෙනවා.[7]

---



**ආගමික පවුල් නීතිය සහ ආගම හැරදැමීමේ නීති සමහර විටක සුළුතර කණ්ඩායම් සාපරාධී ප්‍රහාරයන්ට ගොදුරු වීමේ අවදානමට පත් කරනවා.**
සෑම වසරකම පාකිස්තානයේ හින්දු හා ක්‍රිස්තියානි ගැහැණු ළමයින් සිය ගණනක් පැහැර ගැනීමට සහ බලහත්කාරයෙන් ආගමට හැරවීමට හා විවාහ කිරීමට මුහුණ දෙනවා. වයස අවුරුදු 14 දී මයිරා ෂාබාස්ට මෙය සිදුවුවා. ඇයගේ දෙමව්පියන් ඇයව ආපසු ලබා ගැනීම සඳහා අධිකරණයට ගිය නමුත් ඉස්ලාම් ආගමෙන් ඉවත්වීම පකිස්තානයේ තහනම් කර ඇති නිසාත් මුස්ලිම් දරුවන් ක්‍රිස්තියානි දෙමව්පියන් භාරයේ තබා ගත නොහැකි නිසාත් ඇයව පැහැරගත් තැනැත්තාට ම ආපසු භාර දිය යුතු යැයි මහාධිකරණය තීරණය කළා. සති දෙකකට පසු මයිරා පැන ගියා. ඇය දැන් සැඟවී ජීවත් වෙමින් ඇයගේ විවාහය අවලංගු කර ගැනීමටත්, ඇයගේ නෛතික තත්ත්වය ක්‍රිස්තියානි ලෙස නැවත වෙනස් කර ගැනීමටත් සටන් වදිමින් සිටිනවා.[8]

---




**දේවාපහාස නීතිය සහ ආගම හැරදැමීමේ නීති**
**දේවාපහාසය පිළිබඳ සහ ආගම හැරදැමීම (තම ආගමෙන් ඉවත්වීම) පිළිබඳ නීති බොහෝ විට සාධාරණීකරණය කරනු ලබන්නේ සමගිය පවත්වා ගැනීමට අදාළවයි. කෙසේ වෙතත්, එම නීති මගින් එයට ප්‍රතිවිරුද්ධ බලපෑම ද ඇති විය හැකියි. සමහර රටවල පුද්ගලික පලිගැනීම් සඳහා සාවද්‍ය චෝදනා ඉදිරිපත් කරමින් නීති අවභාවිතා කරනවා. නමුත් නීති මගින් බොහෝ විට ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසට – විශේෂයෙන් ම රජය හෝ බහුතර ප්‍රජාව අකමැති විශ්වාස ඇති පුද්ගලයින්ගේ එම නිදහසට – හානි වන අයුරින් කථනය සහ හැසිරීම සීමා කරනවා.**
මුහම්මද්තුමාගෙන් පසු ව ඇති වූ ශාස්තෘවරයෙකු පිළිබඳ විශ්වාස කරන අහමදිවරුන්, අදේවවාදීන් සහ රජය හෝ ආගමික බලය දරන්නන්ව විවේචනය කරන පුද්ගලයින් බොහෝ විට අවදානමට ලක්වන නමුත් ඕනෑම කෙනෙකු මේ ආකාරයෙන් පීඩාවට පත්වන්නට ඉඩ තිබෙනවා.


---

[6] ද ලීෆ්ලට්, https://www.theleaflet.in/india-needs-to-overhaul-laws-on-interfaith-marriage-and-religious-conversion/
[7] ෆෝරම් ඒසියා, https://www.forum-asia.org/?p=7086
[8] එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුව, https://edm.parliament.uk/early-day-motion/57474/maira-shahbaz-and-child-abduction-forced-conversion-and-marriage-in-pakistan



2020 වර්ෂයේ දී, උතුරු නයිජීරියාවේ ආගමික අධිකරණයක් නබිතුමාට අපහාස කිරීමේ චෝදනාව මත 12 හැවිරිදි මුස්ලිම් පිරිමි ළමයෙකුට වසර 10 ක සිර දඬුවමක් නියම කළා. ඔහුව වරදකරු කරමින් ලබා දුන් තීන්දුව 2021 දී ආගමික නොවන අභියාචනාධිකරණයක් විසින් අවලංගු කළ නමුත්, පළිගැනීමේ ප්‍රහාර හේතුවෙන් ඔහුගේ පවුලේ අයට එම ප්‍රදේශයේ ජීවත් වීම අනාරක්ෂිත වී තිබෙනවා.[9]

---



**ජාත්‍යන්තර නීතියට අනුව, තහනම් කළ යුතු කථනය වන්නේ ප්‍රචණ්ඩත්වය උසිගැන්වීමයි. එහෙත්, ප්‍රචණ්ඩත්වය නවත්වනවා වෙනුවට, බහුතරයක් දෙනා අකමැති විශ්වාස සාමකාමීව ප්‍රකාශ කරන පුද්ගලයින්ට දඬුවම් ලබා දිය යුතුය යන අදහසට සහාය දැක්වීම තුළින් දේවාපහාස සහ ආගම හැරයාමේ නීති මගින් ප්‍රචණ්ඩත්වය දිරිමත් කිරීමේ නැඹුරුවක් තිබෙනවා.**

---




**රජයේ අධීක්ෂණය සහ පාලනය**

**රාජ්‍යය විසින් ආගමික ප්‍රජාවන්ගේ ක්‍රියාකාරකම් සහ මූල්‍ය කටයුතු පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම රාජ්‍ය ක්‍රියාකාරකම් හරහා සීමා කිරීම් නිර්මාණය කරන තවත් පැතිකඩක් වනවා.** උදාහරණයක් හැටියට, ශ්‍රී ලංකාවේ සමහර දේවස්ථාන, බලධාරීන් ගේ අධීක්ෂණයට ලක් වන බව එම දේවස්ථාන වාර්තා කර තිබෙනවා.[10] **මෙය සිවිල් සමාජ අවකාශය හැකිලීමේ පුළුල් ප්‍රවණතාවයක කොටසක්.**

බටහිර චීනයේ සිදු කෙරෙන සෝදිසි කිරීම් අන් කවර ස්ථානයකටත් වඩා අතිශය දැඩි යි. මුස්ලිම් උයිගර් සුළුතර ප්‍රජාවෙහි සාමාජිකයින් හඳුනා ගෙන ඔවුන් සිටින ස්ථාන පොලීසියට දැනුම් දීමට ආරක්ෂක කැමරාවලට හැකි වන පරිදි මුහුණු හඳුනා ගැනීමේ තාක්ෂණය එරටේ වැඩි වශයෙන් යොදා ගෙන තිබෙනවා.[11]

---



**සමාජමය සීමා කිරීම්**

පවුල්, ආගමික කණ්ඩායම් හෝ පුළුල් ප්‍රජාව තුළ ද අයිතිවාසිකම් සීමා කිරීම් සිදු විය හැකියි. මෙය බොහෝ විට පුරුෂයින්ට හා කාන්තාවන්ට බලපාන්නේ වෙනස් ආකාරයකටයි. කාන්තාවන්ට බොහෝ විට විවිධ අවස්ථා, උදාහරණයක් ලෙස දේවධර්මය හැදෑරීමේ අවස්ථාව වැනි අවස්ථා, අහිමි වෙනවා. කාන්තාවන්ගේ හැසිරීම සහ ආගම පිළිපැදීම් ආගමික හේතූන් මත පවුලේ හෝ ප්‍රජාවේ පාලනයට නතු විය හැකියි.

බහුතර සමාජ බොහෝ විට සුළුතර කාන්තාවන්ගේ ආගමික ප්‍රකාශනය ද, උදාහරණයක් හැටියට රැකියා ලබා ගැනීම සඳහා කාන්තවන්ගේ ආගමික අනන්‍යතාවය සැඟවීමට ඔවුන්ට බලපෑම් කිරීම වැනි ආකාර වලින්, සීමා කරනවා.

---



මයිරා ඊජිප්තුවේ ජීවත් වන ක්‍රිස්තියානි තරුණියක්. ඇය විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ගත් විට ඇයට බැංකුවක රැකියාවක් පිරිනමනු ලැබුවා. නමුත් ඇය එම රැකියාව භාර ගන්නේ නම් ඇය හිජාබයක් පැළඳිය යුතු බව ඇයට දැනුම් දුන්නා. වෙනත් ආගමික අනන්‍යතාවයක් ඇති බව මවා පෑම සාධාරණ නොවන බව මයිරා සිතූ නිසා ඇය එම රැකියාව භාර ගැනීම ප්‍රතික්ෂේප කළා.[12]




---

[9] බී.බී.සී. පුවත්, https://www.bbc.com/news/world-africa-55756834
[10] ප්‍රාදේශීය මූලාශ්‍ර
[11] නිව්යෝර්ක් ටයිම්ස්, https://www.nytimes.com/2019/04/14/technology/china-surveillance-artificial-intelligence-racial-profiling.html
[12] මූලාශ්‍රය: මාරියා, ආරක්ෂක හේතූන් මත ඇයගේ නම වෙනස් කර ඇත.



අපි දැන් ප්‍රචණ්ඩත්වය ගැන අවධානය යොමු කරමු. **ප්‍රචණ්ඩත්වයේ වඩාත් සුලභව අත්දැකීමට ලැබෙන ස්වරූප අතරට වෛරී කථාව සහ වෛරී අපරාධ ඇතුළත් වෙනවා. වන්දනා කරන ස්ථාන සහ ඒවාට සහභාගී වන පුද්ගලයින් විශේෂයෙන් ම වෛරී අපරාධවලට ගොදුරුවීමේ අවදානමට මුහුණ දෙනවා.**

බ්‍රසීලයේ සාම්ප්‍රදායික අප්‍රිකානු-බ්‍රසීලියානු ආගම් අදහන පිරිස්, ඔවුන්ගේ ආගම යක්ෂ ආගමක් යැයි සලකන නව පෙන්තකොස්ත ක්‍රිස්තියානි අසල්වැසියන්ගේ ප්‍රචණ්ඩ ප්‍රහාරයන්ට මුහුණ දෙනවා. කැන්ඩොම්බ්ලේ ආගමේ පූජකයෙකු වන මාර්සියෝ පියතුමා තම දේවස්ථානයට සිදුවූ පහරදීම් 20 ට අධික සංඛ්‍යාවක් වාර්තා කර තිබෙනවා. නමුත් පොලිසිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ.[13]



**නැවත වරක්, කාන්තාවන් සහ පිරිමින් වෙනස් ආකාරයකින් පීඩාවට පත්වීමේ ප්‍රවණතාවක් තිබෙනවා.**
ස්වීඩනයේ මුස්ලිම් කාන්තාවන්ට, විශේෂයෙන් හිජාබ් වැනි ආගමික ඇඳුම් අඳින කාන්තාවන්ට, ප්‍රසිද්ධ ස්ථානවලදී ආගන්තුකයින් විසින් සිදුකරනු ලබන වෛරී අපරාධවලට මුහුණ දීමට සිදු වීමේ වැඩි අවදානමක් තිබෙන අතර, මුස්ලිම් පිරිමින් අසල්වැසියන් හෝ සගයන් විසින් සිදු කරනු ලබන වෛරී අපරාධවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් තිබෙනවා.[14]



**බොහෝ ස්ථානවල, කොරෝනා වෛරස් වසංගතය මගින් වෙනස්කම් කිරීමේ රටාවන් හා වෛරයේ පවතින රටාවන් ශක්තිමත් කර තිබෙනවා.** මුස්ලිම් ආගමික උත්සවයකින් පසුව වෛරසය පුළුල්ව පැතිරීමක් සිදුවීම නිසා කොරෝනා ජිහාඩයක් සිදු කළ බවට ඉන්දියාවේ මුස්ලිම්වරුන්ට චෝදනා එල්ල වුණා. අහමඩ් ෂායික් යනු තම ජීවනෝපාය සරිකර ගැනීමට වෙර දරන මුස්ලිම් වීදි වෙළෙන්දෙක්. 2020 අප්‍රේල් මාසයේ දී හින්දු ජාතිකවාදී කල්ලියක් මුස්ලිම්වරුන් කොරෝනා පැතිරවීමට කුමන්ත්‍රණය කරන බවට චෝදනා කරමින් ඔහුගේ වෙළඳ කුටිය ගලවා ගෙන පිටව යන ලෙසට ඔහුට දැනුම් දුන්නා. අහමඩ් ඔවුන්ට ආයාචනය කළ නමුත් ඔවුන් ඔහුට මුගුරුවලින් තදින් පහර දුන්නා. අහමඩ් පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට උත්සාහ කළත් වීදි වෙළඳාම නීති විරෝධී යැයි පවසමින් පොලිසිය පැමිණිල්ල භාරගැනීම ප්‍රතික්ෂේප කළා.[15]



**ප්‍රජාව තුළ පවතින උල්ලංඝනයවීම් වල වඩාත් දරුණුතම ස්වරූපය වන්නේ ජාතිවාදී ප්‍රචණ්ඩත්වය සහ භීෂණයයි.**
සැමුවෙල් දේවගැතිතුමා උතුරු බුර්කිනා ෆාසෝ රටෙහි අයෙක්. එරට පවතින ආගමික ඉවසීමේ සම්ප්‍රදායට දැන් ත්‍රස්ත කණ්ඩායම් හානිකරමින් සිටිනවා. 2019 වර්ෂයේ දී පල්ලිවලට පහර දීම ඔවුන්ගේ උපාය මාර්ගයේ කොටසක් බවට පත්වුණා. සැමුවෙල් දේවගැතිතුමා දැන් අභ්‍යන්තරව අවතැන් වූවන් සඳහා වන කඳවුරකයි ජීවත් වෙන්නේ.

> "මේ ප්‍රහාර අපේ ජනතාවගේ ජීවිත සුනුවිසුනු කර දමා තිබෙනවා. අපි වේදනාවෙන් පිරිලා ඉන්නේ." දේවගැතිතුමා කියනවා.

සෑම කෙනෙකුටම බලපෑම් ඇති කරමින් 2019 සිට ත්‍රස්ත ප්‍රහාර උත්සන්න වී තිබෙනවා. මිලියනයකට අධික ජනතාවක් අවතැන්ව සිටිනවා.[16]

[13] RioOnWatch, https://rioonwatch.org/?p=40117
[14] අපරාධ වැළැක්වීම සඳහා වන ස්විට්සර්ලන්ත ජාතික සභාව, https://www.bra.se/om-bra/nytt-fran-bra/arkiv/press/2021-03-31-islamofobiska-hatbrott-yttrar-sig-i-manga-olika-former.html
[15] සබ්රැන්ග් ඉන්දියා, https://sabrangindia.in/article/stop-targeting-discriminating-against-and-attacking-vendors-and-hawkers-national-hawker
[16] ඕපන් ඩෝර්ස්, එක්සත් රාජධානිය, https://www.opendoorsuk.org/persecution/world-watch-list/burkina-faso




**ඉස්ලාම් දහම සමග සම්බන්ධතා ඇති ත්‍රස්ත කණ්ඩායම් ගෝලීය සංඛ්‍යාලේඛනවල ඉහළින්ම සිටින නමුත්, අනෙක් කණ්ඩායම් විසින් එයටත් වඩා විශාල තර්ජනයක් එල්ල කරනු ලබන බොහෝ ජාතික පසුබිම් ද තිබෙනවා.**
ඇතැම් බටහිර රටවල ආරක්ෂක සේවා, ඔවුන්ට ඇති විශාලතම අභ්‍යන්තර ත්‍රස්ත තර්ජනය ලෙස සලකන්නේ සුදු ජාතික අධිශ්‍රේෂ්ඨත්වවාදීන් සහ අන්ත දක්ෂිණාංශික අන්තවාදීන්වයි.[17] මොවුන්, සුළුතර කණ්ඩායම් ඉලක්ක කරනවා. 2018 දී ඇමරිකා එක්සත් ජනපදයේ පිට්ස්බර්ග් නුවර පල්ලියක දී එකොළොස් දෙනෙක් මරා දමන ලද අතර නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච් නුවර පල්ලියක දී පුද්ගලයින් 51 දෙනෙක් ඝාතනය කරනු ලැබුවා.



**පොලීසිය, ආරක්ෂක සේවා හෝ හමුදාව හෝ රජය විසින් කුලියට ගත් මැරයන් විසින් සිදුකරනු ලබන ප්‍රචණ්ඩත්වයට පුද්ගලයින් හෝ සමස්ත ප්‍රජාව ම ඉලක්ක විය හැකියි.**
රජයේ ප්‍රචණ්ඩත්වය කෙතරම් දරුණු විය හැකිද යන්න බටහිර චීනයේ උයිගර්වරුන්ගේ තත්වය මගින් පෙන්නුම් කෙරෙනවා. උයිගර් කාන්තාවන් බලහත්කාරයෙන් වන්ධ්‍යාකරණයට සහ ගැබ්ගැනීම වළක්වනු ලැබීමට මුහුණ දී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස උපත් අනුපාතය විශාල වශයෙන් පහත වැටී තිබෙනවා. හිජාබයක් ඇඳීම හෝ රැවුල වැවීම වැනි හේතු නිසා උයිගර්වරුන් මිලියන 1.8 ක් පමණ දෙනා නැවත අධ්‍යාපනය ලබාදෙන කඳවුරුවලට යවා තිබෙනවා. මෙම කඳවුරුවලින් වධහිංසා පැමිණවීම් සහ ස්ත්‍රී දූෂණ වාර්තා වන අතර, එහිදී රැඳවියන්ට ඔවුන්ගේ භාෂාව සහ ආගම අහිමි කර රාජ්‍ය මතවාදය ප්‍රගුණ කරවනු ලබනවා. චීන රජය කියා සිටින්නේ මෙම කඳවුරු ස්වේච්ඡා අධ්‍යාපන මධ්‍යස්ථාන බවයි.[18]

**රජයේ වගකීම් සහ අසමර්ථවීම්**



මිනිසුන් ආරක්ෂා කිරීමට රජය අසමත් වීම පිළිබඳව අපි අවසාන වශයෙන් සලකා බලමු. **රජයයන්ට මානව හිමිකම් ආරක්ෂා කිරීමේ වගකීමක් තිබෙනවා. රජයයන් එසේ කිරීමට අපොහොසත් වන විට, වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය ඉහළ යනවා. තනි සිද්ධීන්හි දී එලදායී ලෙස පොලිස් ක්‍රියාමාර්ග ගැනීම උල්ලංඝනයවීම් නැවැත්වීමට උපකාරී වෙනවා.**



ඉස්ලාම් ආගමේ සිට ක්‍රිස්තියානි ආගමට හැරුණු දකුණු කිර්ගිස්තානයේ මහලු කාන්තාවක් 2017 වර්ෂයේ දී මිය ගියා. ඇයගේ දියණිය ඇයව නාගරික සුසාන භූමියේ භූමදාන කිරීමට උත්සාහ කළ විට එම ප්‍රදේශයේ ඉමාම්තුමාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් එයට දැඩි ලෙස ලෙස විරෝධය දැක්වූවා. මේ පිළිබඳව යොමු වූ මහජන අවධානය හේතුවෙන් බලධාරීන් ප්‍රතිචාර දක්වන තෙක් ම, වලදැමූ සිරුර නැවත නැවතත් හාරා ගොඩගෙන තිබෙනවා. එය සිදු කළ වැරදිකරුවන්ට එරෙහිව නඩු පවරනු ලැබූ අතර, ඉන් පසුව, වෙනත් ආගමකට හැරුණු පුද්ගලයින්ට එරෙහි රැඩිකල් හඬ ද වැඩි වී තිබෙනවා.[19]



**පවුල් හෝ ආගමික ප්‍රජාවන් ඇතුළත සිදුවන උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් මැදිහත්වීමට බලධාරීන් බොහෝ විට අපොහොසත් වේ.** ජෝර්දානයේ 22 හැවිරිදි ක්‍රිස්තියානි විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක් වන නාදියා මුස්ලිම්වරයෙකු වන ඇයගේ මිතුරු ශිෂ්‍යයෙකු සමග ආදරයෙන් බැඳුනාය. ඇයගේ පවුලේ අය ඒ බව දැනගත් විට, ඔවුන් ඇයට නිවසින් පිටවීමට ඉඩ නොදී ඇයට වධ හිංසා කළා. නාදියාට නිවසෙන් පලා යාමට හැකි වූ නමුත් මාස දෙකකට පසු ඇගේ පියා ඇයව සොයාගෙන ඇයව මරා දැමුවා. 'ගරුත්වය' පදනම් කරගත් චේතනාවෙන් ඔහු මෙම ක්‍රියාව සිදු කළ බව සැලකූ අධිකරණය ඔහුව සිරගෙට යැව්වේ නැත.[20]


**සමාප්තිය**

[17] එක්සත් ජනපද කොන්ග්‍රසය, https://www.congress.gov/116/bills/s894/BILLS-116s894is.xml
[18] ද ගාඩියන්, https://www.theguardian.com/world/2020/sep/04/muslim-minority-teacher-50-tells-of-forced-sterilisation-in-xinjiang-china
[19] ෆෝරම් 18, https://www.forum18.org/archive.php?article_id=2248
[20] ප්‍රාදේශීය මූලාශ්‍ර



මෙම ඉදිරිපත් කිරීම තුළ අපි ආණ්ඩු සහ ප්‍රජාවේ පුද්ගලයින් විසින් කරනු ලබන වෙනස්කම් කිරීම්, සීමා කිරීම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳව සොයා බැලුවා. එමෙන් ම, මිනිසුන් ආරක්ෂා කිරීමට රජයයන් අපොහොසත් වීම පිළිබඳව ද අපි සොයා බැලුවා.

අපි සවන් දුන් කතා වලින් අපිට නිගමන කිහිපයකට එළඹිය හැකියි:



- සෑම වර්ගයක ම රටවල උල්ලංඝනයවීම් සිදුවන අතර එය සියලු ආගම්වලට සහ විශ්වාසයන්ට අයත් පුද්ගලයින්ට බලපායි. වෙනස් වන්නේ බලපෑමට ලක්ව ඇත්තේ කවුරුන්ද සහ උල්ලංඝනයවීම් කෙතරම් පුළුල්ව පැතිර තිබේද, කෙතරම් නිරතුරුව සිදුවන්නේද හා කෙතරම් බරපතල ද යන්නයි.




- විවිධ ආකාරයේ නීති සහ රජයේ ප්‍රතිපත්ති මෙම උල්ලංඝනයවීම් වලට දායක විය හැකියි.



- සාමාන්‍යයෙන්, බහුතරයන් තුළ සිටින, වෙනස් ලෙස සිතන අය සහ සුළුතර කණ්ඩායම් වඩාත් දැඩි ලෙස බලපෑමට ලක්වෙනවා. එහෙත් බහුතර ප්‍රජාවන් ද, විශේෂයෙන් භීෂණ ප්‍රචණ්ඩත්වයෙන්, උල්ලංඝනයවීම් වල බලපෑමට ලක්වෙනවා.



- ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස උල්ලංඝනයවීම් වලට අනෙකුත් අයිතිවාසිකම් උල්ලංඝනයවීම් ද – උදාහරණයක් ලෙස, අධ්‍යාපනය ලැබීම, විවාහ වීම සහ ජීවත් වීම සඳහා ඇති අයිතීන් වැනි අයිතිවාසිකම් උල්ලංඝනයවීම් ද ඇතුළත් වන බව අපි සවන් දුන් කතන්දර වලින් පැහැදිලි වෙනවා. පිරිමින් සහ කාන්තාවන් වෛරී අපරාධවල සිට, බලහත්කාරයෙන් විවාහ කිරීම, ගරුත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ඝාතනය කිරීම සහ බලහත්කාරයෙන් වන්ධ්‍යාකරණය කිරීම දක්වා වූ කෙතරම් විවිධ වූ ආකාර වලින් බලපෑමට ලක්වන්නේද යන්න මෙම කතා බොහොමයකින් පෙන්නුම් කෙරෙනවා.



- තවද, ප්‍රජාව තුළ සිදුවන උල්ලංඝනයවීම්, රජයේ අපොහොසත්වීම් සහ රජයේ උල්ලංඝනය කිරීම් විෂම චක්‍රයක් නිර්මාණය කරමින් එකිනෙක ශක්තිමත් කරන ආකාරය අප සවන් දුන් කතන්දර ගණනාවකින් පැහැදිලි වෙනවා.



ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස උල්ලංඝනයවීම් සිදුවීම සාමාන්‍ය ජනයාට විශාල වශයෙන් පුද්ගලික පීඩා ගෙන දීමට හේතු වෙනවා. එමෙන් ම ඒවා සමාජය අස්ථාවර කරනවා. අවසානයේ දී, සෑම කෙනෙකු ම අනාරක්ෂිතභාවයෙන් සහ ආර්ථික හා සමාජයීය බලපෑමෙන් පීඩා විඳිනවා.

අප කවුරුන් ද යන්න හෝ අප කුමන ආගමික ප්‍රජාවකට අයත් ද යන්න නොසලකා, අපේ රටේ සියලු මිනිසුන්ගේ ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසට ගරු කිරීම මගින් අපට බොහෝ දේ ලබා ගත හැකියි. අප සියලු දෙනාටම වෙනත් රටවල සුළු ජාතීන් ලෙස ජීවත්වන සහ එම රටවල දී සමාන අයිතිවාසිකම් ලැබෙන බව දැකීමට දැඩි ලෙස අවශ්‍යව සිටින අපගේ සහෝදර ආගමිකයින් සිටිනවා. සෑම තැනක ම සිටින සෑම අයෙකුට ම සමාන අයිතිවාසිකම් ලබා දීම මගින් අපි සියලු දෙනාට ම ආරක්ෂිත ලෝකයක් නිර්මාණය වේවි.